# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 මාර්තු මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන්
පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 6/2012.

## 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "අවස්ථාවෝචිත පරිදි, I වන උපලේඛනයේ හෝ II වන උපලේඛනයේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, I වන උපලේඛනයේ, II වන උපලේඛනයේ හෝ III වන උපලේඛනයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන්:—

"(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු එහෙත් 2012 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන අවස්ථාවල දී;

(ඈ) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන පනහක් නොඉක්මවන, අවස්ථාවල දී."; සහ

2—PL 006660—5,865 (2012/03)

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ "ඒ අදාළ කාර්තුව සඳහා වූ මුළු පිරිවැටුම අදහස් වේ;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ඒ අදාළ කාර්තුව සඳහා වූ මුළු පිරිවැටුම අදහස් වේ:

එසේ වුව ද, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන, එම කාර්තුව අයත් වන තක්සේරු වර්ෂය ආරම්භ වීමට පෙරාතුව ම අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ තක්සේරු කරන ලද, යම් වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ලාභ සංයුක්ත වන බදු අය කළ හැකි ආදායමෙහි කොටස බිංදුවට වඩා වැඩි වන අවස්ථාවක දී, එම කාර්තුව සඳහා අදාළ පිරිවැටුම ශුන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.";

(ආ) (ආ) ඡේදයේ:—

(i) (අ) අනුඡේදයේ (viii) වන අයිතමයේ "එකී හෝටලයේ ක්‍රියාකරුවාගේ හෝ නියෝජිතයාගේ ලැබීම්; සහ" යන වචන වෙනුවට "එකී හෝටලයේ ක්‍රියාකරුවාගේ හෝ නියෝජිතයාගේ ලැබීම්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (අ) අනුඡේදයේ (viii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(ix) මැටි උළු හෝ මැටි භාණ්ඩ නිෂ්පාදකයකු විසින්, ඒ මැටි උළු හෝ මැටි භාණ්ඩ විකිණීමෙන් උපචිත මුදල්; සහ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"II වන උපලේඛනය

(2 වන වගන්තිය)

2011 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 2012 මාර්තු 31 වන දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා

| *යටත්වන පිරිවැටුමේ කොටස* | *එම කොටසට අදාළ වන සේවා ගාස්තු අනුප්‍රමාණය* |
|---|---|
| 1. (අ) ආයෝජන මණ්ඩල (BOI) ඇඟලුම් අපනයනකරුවන්<br>(ආ) ආයෝජන මණ්ඩල වෙළඳ නිවාස<br>(ඇ) ආයෝජන මණ්ඩල ඇඟලුම් අපනයනකරුවන් සඳහා රෙදිපිළි නිෂ්පාදනය කරන නිෂ්පාදකයන් | 0.1% |
| 2. (අ) ආදායම් බද්දෙන් නිදහස් ලාභ<br>(ආ) සහන අනුප්‍රමාණ මත බදු<br>(ඇ) පාඩු<br>(ඈ) (ESC පනතේ අර්ථනිරූපණය කර ඇති නිෂ්පාදකයන් සහ බෙදාහරින්නන් සහ මෝටර් වාහන, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන වෙළඳුන් හැර) තොග හෝ සිල්ලර වෙළඳාමේ යෙදී සිටින තැනැත්තන්<br>(ඉ) කපාපු පොල්, පොල් තෙල් සහ පොල් කෙඳි, කොප්පරා සහ ෂීට් රබර් ඇතුළුව (යම් මද්‍යසාරමය පාන වර්ග හැර) තේ, රබර් හෝ පොල් වගාවන් මූලික පරිවර්තනය කිරීම<br>(ඊ) ප්‍රචාරක නියෝජිතයන් | 0.25% |
| 3. (අ) මෝටර් වාහන, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන වෙළෙඳුන්<br>(ආ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයේ පිරිවැටුම් යන අර්ථ නිරූපණයට ගැනෙන ව්‍යාපාර ඇතුළුව වෙනත් යම් නිෂ්පාදන (බද්දට යටත් නොවන සීමාව නොතකා) | 1%" |

ප්‍රධාන ප්‍රඥප්තියට III වන උපලේඛනය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ III වන උපලේඛනය වශයෙන් බලාත්මක විය යුතු යː—

"III වන උපලේඛනය

(2 වන වගන්තිය)

2012 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලය සඳහා

| | |
|---|---|
| යටත්වන පිරිවැටුම මත | සියයට 0.25" |

අතීතයට බලපෑම.

**5.** මේ පනතේ 3 වන වගන්තිය මගින් ප්‍රතියෝජනය කරනු ලබන ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනයට මේ පනතේ සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.